# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2476/09 - 2026 පෙබරවාරි මස 17 වැනි අඟහරුවාදා - 2026.02.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක P.V. 94125 දරන, මානෙල්වත්ත, බොල්ලැගල, කැලණිය යන ස්ථානයේ පිහිටි, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆොර් බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින් එකී පනත යටතේ සාදනු ලැබූ 2025 සැප්තැම්බර් මස 22 වන දින අංක 2455/08 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ ඇතුළත් I වැනි උපලේඛනයේ (1) ආ කොන්දේසිය වෙනුවට පහත කොන්දේසිය ආදේශ කිරීමෙන් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

(1) (ආ) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත (එස්. එල්. කිව්. එෆ්. 6 වන මට්ටමෙහි) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

ආචාර්ය **හරිනි අමරසූරිය**,<br>
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ<br>
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 31 වැනි දින,<br>
කොළඹ දී ය.

EOG 02 - 0137


1A - PG 7527 - 283 (2026/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*